ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1997 අංක 32 දරන
# ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය පනත

---

[සහතිකය සටහන් කළේ 1997 දෙසැම්බර් මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 දෙසැම්බර් මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 13.50 යි. තැපැල් ගාස්තුව : රු. 4.60 යි.

# 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 1997 දෙසැම්බර් මස 03 වන දින]

එල්.ඩී.–ඕ. 68/96.

**ගුරු අධ්‍යාපනය පිළිබඳ ජාතික අධිකාරියක් පිහිටුවීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් හඳුන්වනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය. *ලුහුඩු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.*

## 1 වන කොටස

## ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය පිහිටුවීම

**2.** (1) මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන, ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය යනුවෙන් හැඳින්වෙන, අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය. *ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය පිහිටුවීම.*

(2) අධිකාරිය, (1) වන උපවගන්තිය මගින් එයට දී ඇති නාමයෙන්, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් එය විසින් ද, එයට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි ය.

**3.** ගුරු අධ්‍යාපන සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ විශේෂයෙන් ම— *අධිකාරියේ කර්තව්‍ය.*

(අ) ආරම්භක ගුරු අධ්‍යාපනය, ප්‍රවර්තන ගුරු අධ්‍යාපනය සහ ගුරුවරුන් සේවයෙහි නියුක්ත කිරීම ඇතුළුව, ඒකාබද්ධ ජාතික ගුරු අධ්‍යාපන ක්‍රමයක් පිහිටුවා පවත්වා ගෙන යාම සඳහා සමස්ත ප්‍රතිපත්ති සංවර්ධනය සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම ;

(ආ) පුහුණු ගුරුවරුන්ගේ තුලනීක්ෂිත අවශ්‍යතා සපුරාලීම සඳහා දැනට පවත්නා ගුරු අධ්‍යාපන ක්‍රමය ක්‍රමවත් කිරීමේ අරමුණ ඇතිව, ජාතික ගුරු අධ්‍යාපන ක්‍රමයේ කටයුතු සැලසුම් කිරීම සහ සම්බන්ධීකරණය කිරීම ;

2 – D 45709 – 5,900 (97/08)

(ඇ) ගුරු අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපන හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම, ඒ අධ්‍යයන හා පර්යේෂණවලින් සොයාගත් කරුණු පතළ කිරීම සහ ඒ හා අනුගාමී කටයුතු ආරම්භ කිරීම ;

(ඈ) ගුරු අධ්‍යාපන වැඩසටහන් හා අධ්‍යයන පාඨමාලාවල ප්‍රගතිය හා කාර්ය සාධනය පිළිබඳව සහ ඒ වැඩසටහන් වල හා අධ්‍යයන පාඨමාලාවල අන්තර්ගතය ප්‍රතිශෝධනය කිරීමේ අවශ්‍යතාව සමීක්ෂණය කිරීම ;

(ඉ) ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපන ක්‍රමයට, දේශීය තත්ත්වයන්ට ගැලපෙන සේ උචිත වෙනස් කිරීම් සහිතව, නවීකෘත පරිචයන්, තාක්ෂණ ක්‍රම සහ විධි යොදා ගැනීම ආරම්භ කිරීම හා ප්‍රවර්ධනය කිරීම ;

(ඊ) ගුරු අධ්‍යාපන ආයතනවල කාර්ය මණ්ඩලය හා ප්‍රධානීන් බඳවා ගැනීමේ පටිපාටි සහ පත් කිරීමේ කාර්ය පටිපාටි සම්බන්ධයෙන් වූ මාර්ගෝපදේශ, අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලය විමසා, සකස් කිරීම ;

(උ) ගුරු අධ්‍යාපන ආයතනවල උපදේශකයන්ගේ සහ ගුරු අධ්‍යාපන ආයතනවල කළමනාකරණ තනතුරුවල යෙදී සිටින වෙනත් තැනැත්තන්ගේ කළමනාකරණ හා වෘත්තීය ප්‍රවීණත්වය වැඩිදියුණු කිරීම සඳහා විධිවිධාන සැලසීම ;

(ඌ) (i) ගුරු අධ්‍යාපන ආයතනවලට ඇතුළත් කර ගැනීම සඳහා වූ අවම සුදුසුකම්වලට අදාළ මාර්ගෝපදේශ ඇතුළුව, ගුරු අධ්‍යාපන ආයතනවල විවිධ අධ්‍යයන පාඨමාලා සහ වැඩසටහන් සඳහා අභ්‍යාසලාභී ගුරු ශිෂ්‍යයන් තෝරා ගැනීම හා ලියාපදිංචි කිරීම සඳහා මාර්ගෝපදේශ, අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලය විමසා, නියම කිරීම ;

(ii) අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුහුණු ගුරුවරුන් සඳහා පවතින ඉල්ලුම සපුරාලීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන, ගුරු අධ්‍යාපන ආයතනවල නව අධ්‍යයන පාඨමාලා සහ වැඩසටහන් ආරම්භ කිරීම හෝ දැනට පවත්නා අධ්‍යයන පාඨමාලා හා වැඩසටහන් නතර කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විමසා, මාර්ගෝපදේශ නියම කිරීම ;

(iii) අභ්‍යාසලාභී ගුරු ශිෂ්‍යයන් විසින් හදාරනු ලබන විවිධ අධ්‍යයන පාඨමාලා හෝ වැඩසටහන්වල දී ප්‍රවීණතාව අත්කරගෙන ඇති අභ්‍යාසලාභී ගුරු ශිෂ්‍යයන් නිසැකව දැන ගැනීමේ කාර්ය සඳහා, ගුරු පුහුණු ආයතනය විසින් පවත්වනු ලබන විභාගවල අන්තර්ගතය සඳහා, ජාතික අධ්‍යාපන ආයතනය විමසා, මාර්ගෝපදේශ නියම කිරීම ;

(iv) ගුරු පුහුණු ආයතනය විසින් ගාස්තු හා වෙනත් අය කිරීම් අය කර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය මාර්ගෝපදේශ නියම කිරීම ;

(එ) අභ්‍යාසලාභී ගුරු ශිෂ්‍යයන් විසින් හදාරනු ලබන අධ්‍යයන පාඨමාලා හෝ වැඩසටහන් පදනම් කර ගෙන, අභ්‍යාසලාභී ගුරු ශිෂ්‍යයන් ගුරු අධ්‍යාපන ආයතනවලට වෙන් කිරීම ;

(ඒ) අධිකාරිය විසින් නියම කර ඇති මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම වරින් වර පරීක්ෂා කර සමාලෝචනය කිරීම සහ උචිත අනුගාමී කටයුතු ආරම්භ කිරීම ;

(ඔ) ගුරු අධ්‍යාපන ආයතන විෂයයෙහි වගකීම ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කාර්ය සාධනය ඇගැයීමේ උචිත ක්‍රම හා මාර්ග දියුණු කිරීම ;

(ඕ) ගුරු අධ්‍යාපනයෙහි යෙදී සිටින, ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි වෙනත් ආයතන හා සංවිධාන සමග සම්බන්ධීකරණයෙන් හා සමවායයෙන් ක්‍රියා කිරීම ;

(ක) අවස්ථාවෝචිත පරිදි, ජාතික අධ්‍යාපන ආයතනය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ විමසා, ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන් පිළිගැනීම සඳහා සුදුසු ක්‍රමෝපාය ආරම්භ කොට ඒවා පවත්වා ගෙන යාම

අධිකාරියේ කර්තව්‍ය වන්නේ ය.

අධිකාරියේ බලතල.

4. මේ පනතේ විධිවිධානවලට යටත්ව, අධිකාරියට පහත සඳහන් බලතල ඇත්තේ ය :—

(අ) 7 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් බඳවා ගැනීමේ පටිපාටි මත, වෘත්තීය සහ ආධාරක කාර්ය මණ්ඩලය පත් කිරීම ;

(ආ) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා යම් චංචල හෝ නිශ්චල දේපලක් අත් කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ දීම, උකස් කිරීම හෝ කුලියට දීම, ඔඩපනය කිරීම හෝ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම :

එසේ වුවද අධිකාරියේ කිසිම නිශ්චල දේපලක් අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් වූ පූර්ව අනුමැතිය නොමැතිව විකුණනු නොලැබිය යුතු ය.

(ඇ) කවර හෝ බැංකුවක හෝ බැංකුවල, ජංගම, ඉතිරිකිරීමේ හෝ තැන්පතු ගිණුම් විවෘත කිරීම හා පවත්වා ගෙන යාම ;

(ඈ) ගුරු අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා තැනැත්තන්ගෙන් හෝ සංවිධානවලින් ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීම ;

(ඉ) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට ඇතුළත් වීම සහ ඒවා ඉටු කිරීම ;

(ඊ) පිරිස් සහ ද්‍රව්‍ය හුවමාරු කිරීම සඳහා, ගුරු අධ්‍යාපනය සංවර්ධනය කිරීමේ නිරත, ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ආයතන සමග සහයෝගිතා ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(උ) අධිකාරිය විසින් ගුරු අධ්‍යාපනය සඳහා සපයනු ලබන යම් සේවා හෝ පහසුකම් වෙනුවෙන් ගාස්තු හෝ වෙනත් අය කිරීම්, අය කිරීම ;

(ඌ) අධිකාරියේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් සහ එහි නිලධරයන් හා සේවකයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුන්ගේ පාරිශ්‍රමික, විනය පාලනය සහ ඔවුන්ට නිවාඩු දීම ඇතුළුව, ඒ නිලධරයන්ට හා සේවකයන්ට අදාළව රීති සෑදීම ; සහ

(එ) පොදුවේ අධිකාරියේ කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම පහසු කරවීම සඳහා අවශ්‍ය වෙනත් සියලු දේ කිරීම.

අධිකාරියේ ශාස්ත්‍රීය බලතල.

**5.** (i) 4 වන වගන්තියෙන් අධිකාරිය වෙත පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, අධිකාරිය විසින් පහත සඳහන් ශාස්ත්‍රීය බලතල ක්‍රියාත්මක කළ යුතු ය:—

(අ) ගුරු අධ්‍යාපනය වෘත්තීමය වශයෙන් සංවර්ධනය කිරීම සහ ඒ පිළිබඳ පර්යේෂණ සඳහා විධිවිධාන සැලසීම :

(ආ) ගුරු වෘත්තියට ඇතුළුවීමට අපේක්ෂා කරන තැනැත්තන් සමත් වී ඇති විභාගවල තත්වය හා හදාරා ඇති අධ්‍යයන පාඨමාලාවල අන්තර්ගතය හා කාලසීමාව සැලකිල්ලට ගෙන, ඒ විභාග හා පාඨමාලා පිළිගැනීම :

එසේ වුවද, යෝග්‍ය යයි අමාත්‍යවරයා සලකන කවර අවස්ථාවක වුවද, අමාත්‍යවරයා විසින් ඒ පිළිගැනීම ඉල්ලා අස්කර ගනු ලැබිය හැකි ය.

(ඇ) ගුරු අධ්‍යාපනය සංවර්ධනය කිරීම හා සම්බන්ධ පර්යේෂණ, සමීක්ෂණ හා විමර්ශන ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම, පැවැත්වීම හා සම්බන්ධීකරණය කිරීම : සහ

(ඈ) ගුරු අධ්‍යාපන ක්ෂේත්‍රයේ යම් නිශ්චිත පර්යේෂණයක්, ව්‍යාපෘතියක්, අධ්‍යයනයක් හෝ සමීක්ෂණයක් සඳහා, යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තන් කණ්ඩායමකට හෝ යම් පිළිගත් ආයතනයකට හෝ ආයතනවලට අවශ්‍ය ප්‍රදාන කිරීම.

අධිකාරියේ පරිපාලනය.

**6.** (1) අධිකාරියේ කටයුතු පරිපාලනය, කළමනාකරණය හා පාලනය (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියේ සභාව වෙත පැවරෙන්නේ ය.

(2) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා, සභාව විසින් මේ පනතින් අධිකාරිය වෙත පැවරී ඇති හෝ නියම කර ඇති හෝ වෙන් කර දී ඇති බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම කළ යුතු ය.

(3) තත් කාර්යය සඳහා සාදන ලද නියෝග වලට අනුකූලව වාර්ෂික වැඩ සටහන හා වැඩ සැලැස්ම සහ වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කර ඒ වැඩ සටහන සැලැස්ම හා වාර්ෂික අයවැය ලේඛනය අමාත්‍යවරයාගේ අනුමතය සඳහා ඉදිරිපත් කිරීම සභාවේ කාර්යය වන්නේ ය.

සභාවේ සංයුතිය.

7. (1) සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) නිල බලයෙන් පවත්වන සාමාජිකයන්, එනම් –

(i) සභාවේ සභාපතිවරයා විය යුතු, අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ii) සභාවේ උප සභාපතිවරයකු විය යුතු, 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතනය පනතින් පිහිටුවූ වන ලද ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(iii) සභාවේ උප සභාපතිවරයකු විය යුතු 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතින් පිහිටුවන ලද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා ;

(iv) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා ;

(v) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් පිහිටුවන ලද හෝ පිහිටුවන ලදැයි සලකනු ලබන සියලුම විශ්වවිද්‍යාලවල අධ්‍යාපන පීඨවල පීඨාධිපතිවරු ;

(vi) ගුරු අධ්‍යාපනය පිළිබඳ ප්‍රධාන කොමසාරිස්වරයා ;

(vii) 10 වන වගන්තිය යටතේ පත් කරන ලද අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා.

(ආ) අනෙකුත් සාමාජිකයන්, එනම් –

(i) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නියෝජිතයෙක් ;

(ii) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නියෝජිතයෙක් ;

(iii) අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වයක් අත්කර ගෙන ඇති තැනැත්තන් අතුරෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වෙනත් තැනැත්තන් අට දෙනෙක්.

(2) යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නම් හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු නම් හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු නම් හෝ එවැනි මන්ත්‍රීවරයකු හෝ සභිකයකු බවට පත් වන්නේ නම්, ඒ තැනැත්තා සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එසේ දිගටම කටයුතු කර ගෙන යාමට සුදුස්සකු නොවිය යුතු ය.

(3) (1) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලැබූ, සභාවේ සෑම සාමාජිකයකු ම—

(අ) අමාත්‍යවරයා විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් ; හෝ

(ආ) අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඔහු ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් සහ ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලියවිල්ලක් මගින් පිළිගනු ලැබුවහොත් ; හෝ

(ඇ) (8) වන උප වගන්තිය යටතේ ධුරයෙන් විශ්‍රාම ගතහොත්

සාමාජිකයකු වශයෙන් ඔහුගේ ධුරය හිස් වන්නේ ය.

(4) (අ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු මිය ගිය හෝ ඉල්ලා අස් වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ හෝ ධුරයෙන් විශ්‍රාම ගනු ලැබූ අවස්ථාවක, එසේ මිය ගිය, ඉල්ලා අස් වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ හෝ ධුරයෙන් විශ්‍රාම ගනු ලැබූ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු, ඒ ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන, අමාත්‍යවරයා විසින් සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබිය හැකි ය.

2—D 045709—5,900 (97/08)

(ආ) මේ උපවගන්තියෙන් (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ යම් සාමාජිකයකු ඔහු ස්වකීය ධූරයෙන් කලින් ඉල්ලා අස්වුව හොත් හෝ මිය යාමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් හෝ විශ්‍රාම ගැනීමෙන් ධූරය හිස් කරත හොත් මිස, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධූරය දැරිය යුතු ය.

(5) රෝගාතුර වීම හෝ වෙනත් යම් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ ස්වකීය ධූරයේ කාර්යය ඉටු කිරීමට (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලැබූ, සභාවේ යම් සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(6) (9) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලැබූ සෑම සාමාජිකයකුම, ඔහු මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබීමෙන් කලින් ධූරය හිස් කරත හොත් මිස, ඔහු ඒ ධූරයට පත් කරනු ලැබූ දිනයේ සිට අවුරුදු හතරක කාලයක් ධූරය දැරිය යුතු ය.

(7) සභාවේ නිලබලයෙන් පත් වූ සෑම සාමාජිකයකු ම , ඔහු සභාවේ සාමාජිකයකු වූයේ යම් තනතුරක් දැරීම ප්‍රකාරව ද , ඒ තනතුර දරන තාක් කල් ධූරය දැරිය යුතු ය.

(8) (1) වන උප වගන්තියේ (ආ) ඡේදයේ (iii) වන අනු ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයන්ගෙන් දෙකෙන් එක් කොටසක් ඔවුන් පත් කරන ලද දිනවල සිට ගණන් බලනු ලබන සෑම අවුරුදු දෙකක කාලය අවසානයේ දී ධූරයෙන් විශ්‍රාම යා යුතු ය.

(9) (8) වන උපවගන්තිය යටතේ සභාවෙන් විශ්‍රාම යා යුතු සාමාජිකයන්, (10) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සෑම අවුරුදු දෙකක කාලය අවසානයේ දී ධූරයේ දීර්ඝතම කාලයක් සේවය කර ඇති සාමාජිකයන් විය යුතු නමුත්, එක හා සමාන කාලයන් සේවය කර ඇති සාමාජිකයන් අතර වන විට, විශ්‍රාම යා යුතු සාමාජිකයන් සභාවේ සභාපතිවරයා විසින් කුසපත් ඇදීමෙන් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(10) සභාවේ සාමාජිකයන් අතුරෙන් (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iii) වන අනුඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයන්ගෙන් දෙකෙන් එක් කොටසක් සෑම දෑවුරුද්දක් අවසානයේ දී ම ධුරයෙන් විශ්‍රාම යන බවට වග බලා ගැනීමේ කාර්යය සඳහා, සභාවට පළමුවෙන් පත් කරනු ලබන සාමාජිකයන් හතර දෙනකුගේ ධුර කාලය, ඔවුන්ගේ පත්වීමේ ලිපිවල නිශ්චය කොට දැක්වෙන පරිදි ඔවුන්ගේ අත්වීමේ දිනයේ සිට අවුරුදු දෙකක කාලයක් ඉකුත් වීමේ දී අවසන් විය යුතු ය.

(11) (3) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හැර, අන්‍යාකාරයකින් ධුරය හිස්කරන යම් සාමාජිකයකු, නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(12) සභාවේ සාමාජිකයන්ට, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකයක්, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

8. අධිකාරියේ මුද්‍රාව– අධිකාරියේ මුද්‍රාව.

(අ) සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් තැනැත්තන් භාරයේ තිබිය යුතු ය ;

(ආ) සභාව විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයේ වෙනස් කිරීම් කරනු ලැබිය හැකි ය ; තවද

(ඇ) සභාවේ අනුමතය ඇතිව මිස සහ තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ලේඛනයට අත්සන් තැබිය යුතු සභාවේ ලේකම්වරයා සහ සභාවේ සාමාජිකයකු ඉදිරියේ දී හැර, කිසිම ලේඛනයක් මත තබනු නොලැබිය යුතු ය.

9. (1) සභාපතිවරයා හෝ ඔහු පැමිණ නොමැති විටක උපසභාපතිවරයන්ගෙන් කෙනකු හෝ සභාවේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. සභාපතිවරයා හා උපසභාපතිවරයන් දෙදෙනාම සභාවේ යම් රැස්වීමකට පැමිණ නොමැති විටක, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දරනු ලැබිය යුතු ය. සභාවේ රැස්වීම්.

(2) සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය, සභාවේ සාමාජිකයන් අට දෙනකුට අඩු නොවිය යුතු ය.

(3) සභාවේ යම් රැස්වීමක දී තීරණයක් ගැනීම සඳහා වූ සියලු ප්‍රශ්න පැමිණ සිටින සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ලැබී ඇති ඡන්ද සංඛ්‍යාව එක සමාන වන විටක සභාපතිවරයාට හෝ සභාවේ යම් රැස්වීමක මූලාසනය දරන වෙනත් යම් සාමාජිකයකුට, තමාගේ ඡන්දයට අතිරේකව තීරණ ඡන්දයක් ද තිබිය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, සභාව විසින්, සභාවේ රැස්වීම් සම්බන්ධයෙන් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් එහි කාර්ය පටිපාටිය විධිමත් කර ගනු ලැබිය හැකි ය.

(5) සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් හෝ එහි සාමාජිකයකු පත් කිරීමේ ලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් පමණක්, සභාවේ කිසිම ක්‍රියාවක් හෝ තීරණයක් හෝ කටයුත්තක් බලරහිත නොවිය යුතු ය.

## II වන කොටස

### අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලය පත් කිරීම

අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම.

10. (1) අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා මෙන් ම ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා ද විය යුතු (මෙහි මින් මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ ජනරාල්වරයකු, අමාත්‍යවරයා විසින් අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධූරය හිස් කරන හොත් මිස, පත් කරන ලද දිනයේ සිට අවුරුදු හතරක කාලයක් සඳහා ධූරය දැරිය යුතු ය.

(3) අධිකාරියේ කටයුතු පරිපාලනය හා අධිකාරියේ කාර්යමණ්ඩලයේ පාලනය සභාවේ විධානයට යටත්ව, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරෙන්නේ ය. සභාවේ සියලු ම තීරණ ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් ද ඔහු වගකිව යුතු ය.

(4) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි, තමා සලකන ප්‍රතිපත්ති හා ක්‍රියා මාර්ග, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සභාවේ සැලකිල්ල සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) සභාවේ හෝ මේ පනතින් හෝ මේ පනත යටතේ පිහිටුවන ලද යම් කමිටුවක යම් රැස්වීමකට පැමිණ සිටීමට, එහි දී කථා කිරීමට හා ඡන්දය දීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හිමිකම තිබිය යුතු ය.

(6) අධ්‍යක්ෂ ජනරාල්වරයා–

(අ) ස්වකීය කාර්ය ඉටු කිරීමට නොහැකි තත්ත්වයකට ස්ථිර වශයෙන් ම පත් වුව හොත්; හෝ

(ආ) අමාත්‍යවරයාගේ මතය අනුව, වංචනික හෝ නීති විරෝධී ස්වභාවයේ වන නැතහොත් අධිකාරියේ යහපතට හානිකර වන ක්‍රියාවක් හෝ දෙයක් කළහොත් : හෝ

(ඇ) ජාතික ප්‍රතිපත්තියට පටහැනිව ක්‍රියා කළහොත්

අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(7) අධ්‍යක්ෂ ජනරාල් ධුරය, ඒ ධුරය දරන්නා මිය ගිය විට, (6) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබූ විට හෝ අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඉල්ලා අස් වූ විට හෝ හිස් විය යුතු ය.

(8) (6) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබී නම් මිස, අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලැබ ඇති යම් තැනැත්තකු අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(9) අධ්‍යක්ෂ ජනරාල් ධුරයේ යම් පුරප්පාඩුවක් ඇති වූ විට, (1) වන උපවගන්තිය යටතේ පත්වීමක් කරනු ලබන තෙක් අධ්‍යක්ෂ ජනරාල් ධුරයේ කාර්ය ඉටු කිරීම පිණිස, අමාත්‍යවරයා විසින් සභාවේ සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(10) අධ්‍යක්ෂ ජනරාල්වරයා අධිකාරියේ ගිණුම් නිලධරයා විය යුතු ය.

සභාවේ බලතල පැවරීම.

11. (1) සභාව විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබිය හැකි යම් බලතල හෝ කර්තව්‍ය, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සභාවේ බලතල හෝ කර්තව්‍ය කිසිවක් පවරනු ලැබ ඇති අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, එසේ තමා වෙත පවරනු ලැබූ බලතල හා කර්තව්‍ය, සභාවේ විශේෂ හෝ පොදු විධානවලට යටත්ව, ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත පවරනු ලැබූ යම් බලයක් හෝ කර්තව්‍යයක්, අධිකාරියේ යම් නිලධරයකුට හෝ සේවකයකුට හෝ අධිකාරියේ යම් කමිටුවකට හෝ පැවරීම අවශ්‍ය යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා සලකන කවර හෝ අවස්ථාවක, ඒ බලතල හෝ කර්තව්‍ය, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සභාවේ ලිඛිත අනුමතය ඇතිව එසේ පවරනු ලැබිය හැකි ය.

කමිටු.

**12.** අධිකාරියේ කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය වූ ද නියමිත සුදුසුකම් සහිත සාමාජිකයන්ගෙන් සමන්විත වූ ද යම් කමිටු, සභාව විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව පත් කරනු ලැබිය හැකි අතර, මේ පනතින් සභාව වෙත පවරනු ලැබ ඇති කවර හෝ කර්තව්‍යයක් සභාව විසින් ඒ කමිටු වෙත පවරා දෙනු ලැබිය හැකි ය.

අධිකාරියේ නිලධරයන් හා සේවකයන්.

**13.** (1) මේ පනතේ විධිවිධානවලට සහ අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගවලට යටත්ව, අධිකාරියේ නිලධරයන් හා සේවකයන් පත් කිරීමට සභාවට බලතල ඇත්තේ ය.

(2) අධිකාරියේ නිලධරයන් සහ සේවකයන් වශයෙන් කරනු ලබන සෑම පත් කිරීමක් ම නියෝග මගින් නියමිත, පත්වීම් කිරීම සඳහා වූ බඳවා ගැනීමේ පටිපාටියට සහ කාර්ය පටිපාටියට අනුකූලව, සභාව විසින් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ විධිවිධානවලට සහ අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගවලට යටත්ව, අධිකාරියේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ වේතන, වැටුප් හා වෙනත් පාරිශ්‍රමික ඇතුළුව, ඒ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සේවා නියම හා කොන්දේසි සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(4) අධිකාරියේ නිලධරයන් හා සේවකයන්, සේවයෙන් පහ කිරීමේ බලය ද ඇතුළුව සභාවේ විනය පාලනයට යටත් විය යුතු ය. සභාව විසින් විනය කාරණා පිළිබඳ ව රීති සාදනු ලැබිය හැකි ය.

(5) සභාව විසින්, අධිකාරියේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ ප්‍රතිලාභය සඳහා අර්ථ සාධක අරමුදල් සහ යෝජනා ක්‍රම පිහිටුවා, විධිමත් කරනු ලැබිය හැකි අතර, එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට සභාව විසින් දායක මුදල් ගෙවනු ලැබිය හැකි ය.

ඇතැම් ගිවිසුම්වල කාර්යය සඳහා අධිකාරියට කරනු ලබන සේවය ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**14.** යම් නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට ඇතුළත් ව ඇති යම් තැනැත්තකු, අධිකාරිය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරියට කරන ලද යම් සේවා කාලයක්, ඒ ගිවිසුමේ බැඳීම් නිදහස් කරලීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

**15.** (1) සභාවේ ඉල්ලීම පිට, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතේ වූ යම් ආයතනයක හෝ දෙපාර්තමේන්තුවක රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයෙකු, රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව දෙනු ලැබූ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ ඒ නිලධරයාගේ කැමැත්ත ඇතිව, සභාව විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය : නැතහොත්, එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) සභාවේ ඉල්ලීම පිට, (1) වන උපවගන්තියෙහි සඳහන් නිලධරයකු නොවන රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු, ඒ නිලධරයාගේ ද රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) අධිකාරියේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) සභාවේ ඉල්ලීම පිට, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද යම් උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ ද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ ද කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව, සභාව විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය : නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව, ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(6) යම් උසස් අධ්‍යාපන ආයතනයක නිලධරයකු හෝ සේවකයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඔහු ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම යටත් විය යුතු ය.

## III වන කොටස

## මුදල්

අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය.

16. (1) පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයකින් නිශ්චය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයක් අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය විය යුතු ය.

(2) අධිකාරියේ ප්‍රාග්ධනය, යම් විසර්ජන පනතකින් හෝ පාර්ලිමේන්තු යෝජනා සම්මතයකින් හෝ බලය දෙනු ලබන යම් මුදල් ප්‍රමාණවලින් වැඩි කරනු ලැබිය හැකි ය.

අධිකාරියේ අරමුදල.

17. (1) අධිකාරියට අධිකාරියේ ම අරමුදලක් තිබිය යුතු ය.

(2) අධිකාරියේ අරමුදලට—

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් :

(ආ) අධිකාරියේ බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී අධිකාරියට ලැබෙන සියලු මුදල් : සහ

(ඇ) කවර හෝ ප්‍රභවයකින්, ණය ආයෝජන මත පොලී, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල් සහ අධිකාරිය විසින් ඉටු කරනු ලබන සේවා හෝ සපයනු ලබන පහසුකම් සඳහා අයකරනු ලබන ගාස්තු බැර කරනු ලැබිය යුතු ය.

(3) ආයතනයේ අරමුදලින් —

(අ) මේ පනත යටතේ අධිකාරියේ බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ; සහ

(ආ) මේ පනතින් හෝ මේ පනත යටතේ අරමුදලින් ගෙවීමට නියමිත සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

(4) අරමුදලට අයත් සියලු මුදල් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් බැංකුවල තැන්පත් කිරීම හෝ එසේ නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් ආයෝජනය කිරීම හෝ කරනු ලැබිය යුතු ය.

අධිකාරියේ මුදල් වර්ෂය.

18. (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) අධිකාරිය විසින්, අධිකාරියේ ආදායම හා වියදම සම්බන්ධයෙන් ද වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් ද වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් ද නිසි ගිණුම් පොත් තබා ගැනීමට සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, අධිකාරියේ ගිණුම් විගණනය කිරීමට හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අදාළ කිරීම.

19. මේ පනතේ ඉහතින් වූ විධිවිධානවල සලසා ඇති යම් ප්‍රකාශිත විධිවිධානයකට යටත්ව, 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අධිකාරියේ මුදල් පාලනය හා ගිණුම්වලට සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## IV වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

සභාවට අදාළව අමාත්‍යවරයා සතු බලතල.

**20.** (1) සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් වූ යම් සාමාන්‍ය හෝ විශේෂ විධාන, අමාත්‍යවරයා විසින් කලින් කල සභාවට ලිඛිතව නිකුත් කළ හැකි අතර, ඒ විධාන ක්‍රියාත්මක කිරීම සභාවේ කාර්යය විය යුතු ය.

(2) අධිකාරියේ කටයුතු සියල්ල හෝ ඉන් කිසිවක් තමා විසින් නිශ්චය කරනු ලබන යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් විමර්ශනය කොට වාර්තා කළ යුතු යයි අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි අතර, එවැනි නියමයක් කරනු ලැබූ විට, ඒ නියමය ක්‍රියාත්මක කිරීම සඳහා ඒ තැනැත්තාට හෝ තැනැත්තන්ට අවශ්‍ය සියලු පහසුකම් සැලසීම හා සියලු තොරතුරු සැපයීම සභාව විසින් කළ යුතු ය.

(3) සභාව විසින්, තුන් අවුරුදු වැඩ සැලැස්ම, වාර්ෂික සැලැස්ම හා වැඩ සටහන සහ වාර්ෂික අයවැය ලේඛනය අමාත්‍යවරයාගේ එකඟත්වය සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

චංචල හා නිශ්චල යන දෙයාකාරයේ ම දේපල අධිකාරියට ලබා දිය යුතු බව.

**21.** (1) අධිකාරියේ කාර්ය සඳහා අධිකාරියට අවශ්‍ය වන, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ යම් චංචල හෝ නිශ්චල දේපලක්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් අධිකාරියට පවරා දෙනු ලැබිය හැකි අතර, එසේ පවරා දෙනු ලැබූ යම් දේපලක් ඒ නියමයේ දිනයේ සිට අධිකාරිය සතුව අධිකාරියේ දේපල බවට පත් වන්නේ ය.

(2) රජය සතුව ඇති නිශ්චල දේපලක් නොවන, යම් නිශ්චල දේපලක්, අධිකාරියේ යම් නිශ්චිත කාර්යයක් සඳහා අත්කර ගැනීමට අවශ්‍ය වන සහ ඒ යෝජිත අත්කර ගැනීම ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ඒ කාර්යය සඳහා අනුමත කරනු ලබන අවස්ථාවක, ඒ දේපල පොදු කාර්යයක් සඳහා අත්කර ගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ දේපල ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කරගෙන අධිකාරිය වෙත පවරා දෙනු ලැබිය හැකි ය.

(3) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අධිකාරිය සඳහා යම් නිශ්චල දේපලක් අත් කර ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු යම් මුදලක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) රජයට අයත් යම් චංචල දේපලක් අධිකාරියේ කාර්යය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයන් මගින්, අමාත්‍යවරයා විසින්, ඒ දේපලෙහි සන්තකය හා පාවිච්චිය අධිකාරිය වෙත පවරා සතු කර දෙනු ලැබිය හැකි ය :

එසේ වුවද රජයට අයත් යම් චංචල දේපලක් කෙරෙහි බලපාන කිසිම නියමයක්, ඒ දේපල විෂයයෙහි පාලනය ඇති අමාත්‍යවරයාගේ එකහත්වය නොමැතිව, අමාත්‍යවරයා විසින්, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ කරනු නොලැබිය යුතු ය.

22. එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු මාස හයක කාලයක් ඇතුළත, ඒ ඒ වර්ෂය තුළ අධිකාරියේ කටයුතු පිළිබඳ සම්පූර්ණ විස්තරයක් දැක්වෙන වාර්තාවක්, සභාව විසින්, අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින් ඒ වාර්තාව අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ අවසානයට පෙර, පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

*සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු බව.*

23. අධිකාරිය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

*අධිකාරිය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.*

24. සභාවේ සියලුම සාමාජිකයන් සහ අධිකාරියේ නිලධරයන් හා සේවකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

*සභාවේ සාමාජිකයන් සහ අධිකාරියේ නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.*

25. (1) (අ) මේ පනත යටතේ අධිකාරිය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධව :

*මේ පනත යටතේ කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.*

(ආ) මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත සභාවේ යම් සාමාජිකයකු විසින් හෝ අධිකාරියේ නිලධරයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන්

කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ නිලධරයාට, සාමාජිකයාට හෝ සේවකයාට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව හෝ යම් අධිකරණයක් ඉදිරියෙහි ගෙනෙනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක්, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය වෙත ගෙවන ලද හෝ අධිකාරිය විසින් අය කර ගන්නා ලද ගාස්තු කිසිවක්, අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උප වගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත හෝ තමා විසින් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඒ තැනැත්තාට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කරන්නේ නම් ඒ වියදම, ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අය කරනු ලැබී නම් මිස, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

නියෝග.

**26.** මේ පනතේ විධිවිධානවලට යටත්ව, අමාත්‍යවරයා විසින් සභාව විමසීමෙන් පසු, පහත සඳහන් කාරණා සියල්ලම හෝ ඉන් යම් කිසි කාරණයක් සම්බන්ධයෙන්, නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) අධිකාරියේ කාර්ය මණ්ඩලයේ පාරිශ්‍රමික ද ඇතුළුව, ඒ කාර්ය මණ්ඩලයේ සේවා නියම හා කොන්දේසි :

(ආ) අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කිරීම සඳහා වූ බඳවා ගැනීමේ පටිපාටිය සහ කාර්ය පටිපාටිය :

(ඇ) සභාවේ සංයුතිය හා එහි කටයුතු කර ගෙන යාම :

(ඈ) අධිකාරියේ තුන් අවුරුදු වැඩ සැලැස්ම, වාර්ෂික සැලැස්මේ හා වැඩසටහනේ සහ වාර්ෂික අයවැය ලේඛනයේ ආකෘතිය සහ ඒ වැඩ සැලැස්ම, වාර්ෂික සැලැස්ම හා වැඩසටහන සහ වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කළ යුතු ආකාරය ;

(ඉ) නියමිත යයි මේ පනතින් නියම කර ඇති හෝ නියෝග සෑදීමට මේ පනතින් නියම කර ඇති සියලු කාරණා.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක, එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු, හැකි පහසු ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ ඊට කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක්, එසේ පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

වෙනත් ඇතැම් නීති අභිභවා මේ පනත බලපැවැත්විය යුතු බව.

**27.** මේ පනතේ විධිවිධාන ද, 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනතේ සහ 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතනය පනතේ විධිවිධාන ද, අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**28.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**29.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි —

"අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලය", යන්නෙන්, 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනත මගින් පිහිටුවන ලද අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලය අදහස් වේ ;

"උසස් අධ්‍යාපන ආයතනය" සහ "ප්‍රධාන විධායක නිලධරයා" යන්නෙහි, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් ඒවාට පිළිවෙළින් දී ඇති අර්ථය ම ඇත්තේ ය:

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක්, හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන, ඉටු කරන හෝ කරන බලතලවලට, කාර්යවලට හා කර්තව්‍යවලට, අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ ඇතිකොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ :

"ජාතික අධ්‍යාපන ආයතනය" යන්නෙන්, 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතනය පනත මගින් පිහිටුවන ලද ජාතික අධ්‍යාපන ආයතනය අදහස් වේ :

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය මගින් පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ :

"විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව" යන්නෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ .